වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය.
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිව්‍යුහගත කරන ලද දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු. 18,156,266 ක් හා හිඟ පොලිය රු. 4,681,381 ක්වූ එකතුව රු. 22,837,647 ක්, සමුච්චිත අරමුල් ගිණුම හර කර, ණය මුදල් ගිණුම බැර කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුම හර ශේෂයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 303,383 ක් අදාල වියදම් ගිණුම් හර කර ණයහිමි ගිණුම් බැර කල යුතු වුවත්, එසේ නොකොට ඉදිරි වර්ෂයේ වැය ශීර්ෂය හරහා ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ඉදිකිරීම් කර්මාන්ත ණයහිමියන් සඳහා රු. 4,888,374 ක මුදලක් වෙන්කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 1,891,410 ක් වුවද, බිල් කිරීම් ලෙස රු. 2,020,118 දැක්වීමෙන් එම ආදායම් රු. 128,708 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------- |
| (අ) | 2009 මාර්තු 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 චක්‍රලේඛය | ඕපනායක පොදු වෙළඳසැල අසල සභාවට අයත් කඩකාමර 08 ක් අදාල පාර්ශවයන් සමඟ ගිවිසුම් ගතවීමකින් තොරව 1996 වර්ෂයේ සිට බදු දී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 371 | 1988 වර්ෂයේ සිට ලබාදෙන ලද රු. 2,371,861 ක අත්තිකාරම් පියවීමට හෝ නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරක් අනාවරණය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 570, 571 හා 572 | 1978 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු. 532,005 ක ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 2011පෙබරවාරි10දිනැතිඅංකජා.ගො.ප.ස.2 011/1 | නාය යෑම් අවදානම් සහිත දිස්ත්‍රික්ක වල කවර හෝ ඉදිකිරීමක් සිදු කිරීමට අවසරය ලබා දීමට පෙර අදාල |

ප්‍රාදේශීය සභාව විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අදාල යෝග්‍යතා සහතිකය/ නිර්දේශය ලබා ගැනීම අනිවාර්යයෙන්ම සිදු කල යුතු වුවද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි සැලසුම් 20 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කමිටු තීරණයකින් තොරව සභාපතිවරයාගේ අනුමැතිය ලබා දී තිබුණි. තවද, ඉදිකිරීම් අවසන් කල පසු අනුකූලතා සහතිකය නිකුත් කිරීමේදී නියමිත නිර්දේශය ක්‍රියාත්මක කර ඇත්දැයි අවධානයට ලක් කිරීම අනිවාර්යය වුවද, එවැනි ක්‍රියාවලියක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,305,066 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,784,070 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 479,004 කින් අඩුවී තිබූ අතර, එය සියයට 12.65 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීමත්, වරිපනම් බදු ආදායම අඩුවීමත් වේ.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,776 | 6,736 | 2,195 |
| බදු කුලී | 967 | 870 | 197 |
| බලපත්‍ර ගාස්තු | 730 | 858 | 14 |
| වෙනත් ආදායම් | 12,650 | 7,551 | 1,850 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

----------------------------------------

සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු සහ බලපත්‍ර ගාස්තු, ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායම වැඩිවීමක් පෙන්නුම් කලද, බදුකුළී ආදායම, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම්හි ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. ඒ අනුව සමස්ථ ආදායම රැස්කිරීමේදී සියයට 19.72 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

2.3.3 වරිපනම් බදු

----------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රු. 300 ට වඩා වැඩි හිඟ වරිපනම් බදු ඒකක 1101 ක්වූ අතර, එම වටිනාකම රු. 1,501,914 ක් විය.

2.3.4 බදු කුලී

--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැලිගෙපොල සතිපොල හා මාළු ලැල්ල බදු ලබාගත් බදුකරුගෙන් පිළිවෙලින් රු. 3,828 ක්ද, රු. 43,500 ක්ද, වශයෙන් එකතුව රු. 47,328 ක ආදායම් 2014 වර්ෂය සඳහා ලැබී නොමැති අතර, දඩ වශයෙන් පිළිවෙලින් රු. 31,920 ක් හා රු. 32,760 ක් වශයෙන් රු. 64,680 ක එම ආදායම් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලය වෙත යොමුකර තිබුණි.

(ආ) 2009, 2013 හා 2014 වර්ෂයන්ට අදාලව සභාව සතු සතිපොල සහ මාළු ලැලි වලට අදාලව රු. 52,090 ක ආදායම් හිඟව පැවතුණි. එයින් රු. 33,190 ක හිඟ පුද්ගලයින් වෙනුවෙන් නඩු පවරා තිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

-----------------

සභා බල ප්‍රදේශය තුල පවතින ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ලේඛණගත කර එම ආයතන මඟින් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අය කරනු වෙනුවට දැනටමත් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ගෙවනු ලබන ආයතන පමණක් ලේඛණගත කර අයකිරීම් කරන බව නිරීක්ෂණය විය. 2013 වර්ෂයේ ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ලේඛණයේ බදු අයකරන ලද ව්‍යාපාරික ස්ථාන 2014 වර්ෂයේ ලේඛණ අනුව හඳුනාගැනීමට නොහැකි වන අවස්ථාද නිරීක්ෂණය විය.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

මහේස්ත්‍රාත් අධිකරණ දෙකක, බල ප්‍රදේශ තුලින් ප්‍රාදේශීය සභාව උසාවි දඩ ආදායම් ලබන අතර, එයින් එක් අධිකරණයක් මඟින් 2013 හා 2014 වර්ෂයන්ට අදාලව රු. 413,374 ක ආදායම් ප්‍රාදේශීය සභා අරමුදලට අයවිය යුතුව තිබුණි.

2.3.7 ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු ආදායම්

------------------------------------------------

සියළු ස්ථාවර හා තාවකාලික දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අනුමැතිය ප්‍රාදේශීය සභාව මඟින් ලබා නොගන්නා බවත්, අදාල ගාස්තු අයකිරීම සිදු නොවන බවත්, කාර්යාලයට පැමිණ කරන ගෙවීම් පමණක් ලේඛණගත කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දැන්වීම් පුවරු 04 ක් සඳහා රු. 161,620 ක ආදායමක් පමණක් ලැබී තිබුණි.

2.3.8 සන්නිවේදන කුළුණු ගාස්තු

----------------------------------

නාගරික සංවර්ධන හා පූජාභූමි අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව සභා බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති හඳුනාගෙන නොමැති සන්නිවේදන කුළුණු හඳුනාගෙන ඒ සඳහා වන අදාල බදු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 සහ 2014 වර්ෂයන්හීදී පිළිවෙලින් රු. 37,343 ක්, රු. 51,511 ක් වශයෙන් එකතුව රු. 88,854 ක් සභාවේ විශ්‍රාම ගිය නිළධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා ඇති නමුත්, දායක මුදල් ගෙවීම අදාල වන නිළධාරීන් හා කාලපරිච්ඡේද පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

(ආ) 2014 දෙසැම්බර් මාසය තුල තාක්ෂණික කමිටු තීරණයකින් තොරව සභාපතිවරයාගේ අනුමැතියෙන් පමණක් රු. 951,100 ක වටිනාකමැති "ක්‍රෝබා" වර්ගයේ වීථි පහන් මිලදී ගෙන තිබුණි. එයින් රු. 810,000 ක්වූ වොට් 250 හා වොට් 125 ක ධාරිතාවයෙන් යුත් ක්‍රෝබා වර්ගයේ වීථි පහන් කට්ටල 85 ක් සහ 2014 නොවැම්බර් 27 දින ණයහිමි පදනම මත මිලදීගත් රු. 422,500 ක් වටිනාකමැති ක්‍රෝබා වර්ගයේ වොට් 250 ක වීථි පහන් කට්ටල 40 ක් විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ නිර්දේශ නොසලකා මිලදී ගෙන තිබුණි. තවද, ලංකා විදුලි බල මණ්ඩලයේ අවසරයකින් තොරව සවිකල වොට් 250 ක ධාරිතාවයෙන් යුත් වීථි පහන් 72 ක් අතරින් පරීක්ෂණ අවස්ථාව වූ 2015 මාර්තු මස වනවිට වීථි පහන් 23 ක් මණ්ඩලය විසින් විසන්ධි කර තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් සියයට 9 ක ණය පොළී ප්‍රතිශතයක් යටතේ ලබාගත් රු. 22,837,647 ක ණය මුදලක් මත විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන උතුරු හුණුවල පැලැන්ද කන්ද ජල යෝජනා ක්‍රමය මඟින් සමාලෝචිත වර්ෂයට බිල්කල ආදායම රු. 1,218,851 ක් වුවද, ආදායම් වශයෙන් ලද මුදල රු. 941,782 ක් විය. උක්ත ජල යෝජනා ක්‍රමය සඳහා විදුලි බිල්පත් වෙනුවෙන් පමණක් රු. 1,645,857 ක වියදමක් දරා ඇති අතර, නඩත්තු කටයුතු හා සේවක වැටුප්

සඳහාද වියදම් දරා තිබුණි. තවද, උක්ත ණය මුදල සඳහා රු. 408,516 ක පොළී මුදලක් ගෙවීමට ඇති අතර, දිගින් දිගටම ණය මුදල සඳහා වන වාරික ගෙවීම සිදුකර නොතිබුණි. උක්ත ජල යෝජනා ක්‍රමයට අවශ්‍ය වන ජල ප්‍රමාණය මල්මීකන්ද ජල යෝජනා ක්‍රමය මඟින් ලබා ගැනීමට අපේක්ෂා කලද, එම යෝජනා ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම මත විදුලි බිල අඩු කර ගැනීමද එමගින් ඇහිරී තිබුණි.

(ඈ) සභාව මඟින් ජල ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කරන අතර, එම ජල ව්‍යාපෘති සඳහා බිල්කල ආදායම රු. 3,709,448 ක් විය. එම ආදායමින් රු. 3,274,311 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණි. මෙම ජල ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රාදේශීය සභාව රු.5,426,515 ක වියදම දරා තිබූ අතර, ජල ව්‍යාපෘති හේතුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලට රු. 1,717,067 ක මෙහෙයුම් අලාභයක් සිදු වී තිබුණි.

(ඉ) මාදොල ගම්සභා උසාවිවත්ත ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සභාවට මැන වෙන්කර දීම සඳහා 2014 නොවැම්බර් 17 දිනැති ලිපිය මඟින් කටයුතු කර තිබුණද, එහි මායිම් ලකුණු කර අදාල කටයුතු නිමකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. එසේම රු. 600,000 ක වියදමින් එම ඉඩම සඳහා පිවිසීමට ඉදිකල මාර්ගයේ දැඩි වර්ෂාව හේතුවෙන් සෝදා පාළුවට ලක්වී තිබුණි.

## 3.2 අවිධිමත් ගනුදෙනු

--------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

සභාපතිවරයාට තම බල ප්‍රදේශය තුල සිදු කරන ලද ගමන් බිමන් වෙනුවෙන් සංයුක්ත දීමනා ලබාගත නොහැකි වුවද, 2014 වර්ෂයේදි රු. 73,000 ක්ද, 2013 වර්ෂයේදි රු. 60,000 ක්ද, ලෙස එකතුව රු. 133,000 ක් ලබාගෙන තිබුණි. තවද, සභා බල ප්‍රදේශයෙන් පිටත ගමන් සඳහා තම රාජකාරිය හෝ රාජකාරිය සඳහා වන අනුමැතිය පිළිබඳ කිසිදු සඳහනකින් තොරව 2014 වර්ෂයේ රු. 445,675 ක් සභා අරමුදලින් වැය දරා ඇති අතර, එම ගමන් පිළිබඳව අවශ්‍යතාවය හෝ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

මෙසේ 2014 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ ගමන් බිමන් සඳහා දින 146 ක්ද, සභා බල ප්‍රදේශයේ පිට දින 95 ක් ලෙස එකතුව දින 241 ක් වර්ෂය තුලදී සංයුක්ත දීමනා වශයෙන් ලබාගෙන තිබූ අතර, වර්ෂයේ ප්‍රසිද්ධ නිවාඩු දින හා සෙනසුරාදා, ඉරිදා සතිඅන්ත ලෙස නිවාඩු දින 123 ක් සැලකූ විට වර්ෂය තුලදී කාර්යාලයේ රාජකාරී සඳහා දින 01 ක් පමණක් රැදී ඇති බැව් අනාවරණය විය.

(ආ) සභාව සතු කැබ් රථය අළුත්වැඩියාව සිදු කරන ලද කාලය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ හෝ මහා සභාවේ අනුමැතියකින් තොරව කිලෝමීටර් 12816 ක් සඳහා රු. 385,500 ක කුළී රථ ගාස්තු ගෙවා තිබුණි. තවද, සභාපතිවරයා වෙනුවෙන් මසකට ඉන්ධන ලීටර් 700 ක් සඳහා සභා අනුමැතිය ලැබී තිබුණද, 2014 ජුනි, ජූලි මාස සඳහා ඊට පටහැනිව වැඩිපුර ඉන්ධන ලීටර් 250 ක් වෙනුවෙන් රු. 30,300 ක් ද සභා අරමුදලින් වියදම් දරා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) මල්මී කන්ද ජල ව්‍යාපෘතිය

-------------------------------------

මල්මී කන්ද ජල ව්‍යාපෘතිය ඍජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කර තිබූ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව මිල අඩුම ආයතනය මඟින් කිසිඳු අනුමැතියකින් තොරව හා තාක්ෂණික ඇගයීමකින්ද තොරව තත්ත්ව වාර්තාවක් හෝ ලබා නොගෙන ජල මීටර් 300 ක් ඇතුළු ද්‍රව්‍ය රු. 1,368,975 ක් වැයකර මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතියේ ඉටු කරන ලද වැඩ වෙනුවෙන් 2014 වර්ෂයේදී සභා අරමුදලින් දරන ලද රු. 1,773,390 ක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයට යොමු කර තිබූ නමුත් විගණිත දිනය වූ 2015 පෙබරවාරි 13 වනවිටත් එම බිල්පත් ප්‍රතිපූර්ණය වී නොතිබූ අතර, මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිසංස්කරණය කර තිබූ ජල ටැංකි හා පිළිසකර කර තිබූ ජලනල පද්ධතිය අතහැර දමා තිබුණි.

(ආ) දකුණු හුණුවල පාලම අසල මාර්ගය

---------------------------------------------

දකුණු හුණුවල පාලම අසල සිට පහළවෙල මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සඳහා රු. 1,770,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ අනුමත සමිතියක් සමඟ ගිවිසුම්ගතව තිබූ කර්මාන්තය සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 13 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව වැඩ ආරම්භ කර තිබූ අදාල මාර්ගයේ 4" ගල් යෙදීම පමණක් සිදු කර තිබුණි. අදාල කර්මාන්තයේ ඇල මායිම සඳහා පැවති පැරණි අබලන් පැති බැම්ම දැඩි වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුරට මීටර් 50 ක් පමණ දිගට සහ මාර්ගතලය මීටර් 07 ක් පමණ පළල කොටස ඇල මාර්ගයට ගසාගෙන ගොස් තිබුණි.

(ඇ) මල්මී කන්ද මාර්ගය

--------------------------

රු. 1,960,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ අනුමත සමිතියක් සමඟ මාස 03 කාලයක් සඳහා ගිවිසුම්ගතව තිබූ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල මීටර් 100 සිට කිලෝමීටර් 01 මීටර් 400 ක් දක්වා මල්මීකන්ද පාර තාර දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මීටර් 100 සිට මීටර් 700 දක්වා වූ කොටස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලම් ගරා මාර්ගතලයට බරපතල හානිදායක තත්ත්වයක් ඇති කිරීම හේතුවෙන් සංවර්ධන කටයුතු සිදු නොකර අතහැර ඉතිරි කොටස සංවර්ධනය කිරීම වෙනුවෙන් රැඳවුම් මුදල් අඩු කිරීමකින් තොරව රු. 926,722 ක මුදලක් ගිවිසුම්ගත සමිතියට ගෙවා තිබුණි. සභාවට අයත් මෙම මාර්ගයට දිගින් දිගටම සිදු වන හානිය වලක්වා ගැනීමට 2015 පෙබරවාරි 13 දින දක්වා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) කැන්දකැටිය මාර්ගය

---------------------------

කැන්දකැටිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සහ කොන්ගස්තැන්න අහුලියද්ද මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම සඳහා පිළිවෙලින් 2014 නොවැම්බර් 01 සහ අගෝස්තු 08 දින වලදී මාස තුන බැගින් වූ කාලයක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා රු. 498,000 ක අත්තිකාරමක් අනුමත සමිතිය වෙත ලබා දී තිබුණද, භෞතික පරීක්ෂණ දිනය වූ 2015 පෙබරවාරි 13 දින වනවිටත් උක්ත කර්මාන්තයන්හි වැඩ ආරම්භ කර නොතිබුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

----------------------

2014 වර්ෂයේ අයවැය යෝජනා යටතේ රු. 800,000 ක් වටිනාකමැති යෝජනා 10 ක් ක්‍රියාත්මක කිරීමට යෝජිත වුවද, ඉන් රු. 700,000 ක් වටිනාකමැති කර්මාන්ත 09 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

4. පද්ධති හා පාලනය.

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය